තව හෝරාවකින් පමණ තනි රකින්නට එන සිරිමල්ගේ මව වන ඇලිස් අක්කාට ද තේ එකක් සාදා සිරිමල් තේ බොන්න යි කියමින් තම තේ කෝප්පය රැගෙන ජනී සාලයට එන විට ඇඳිරි වැටීමට ආසන්න ය. අද දවසේ වැඩි කාලයක් ඇය ගත කළේ ගේදොර පිරිසිදු කිරීමට ය. පාසැලේ පහ වසර ඉගෙනුම ලබන සිරිමල් ඒ හැම කාරියකට ම අත දුන්නේ ඉතා කලුපග ව ඇය පසුපස යමිණි.

ජනී නැන්දෙ මම මල් පාත්තියට වතුර දාල එන්නං .. සිරිමල්ගේ හැම වැකියක ම ජනී නැන්දෙ යන වචන දෙක අඩංගු ය. ඇලිස් ඇය අමතන්නේ ජනී නෝනී කියා ය. ඒ වැඩි ආදරයට ය. සෙසු ගම්වැස්සෝ ඇයට ජනී නෝනා යැ යි කියති.
ඇලිස් හා සිරිමල් නිවසන්නේ ගෙවල් කීපයකට නුදුරිණි. එහෙත් ජනී නෝනිගේ ගෙදර ද ඔවුන්ට නිරන්තරයෙන් වෙන් වූ එක් කාමරයක් ඇත.
මෙම නිවස තරමක් විශාල ය. එහි කාමර හතරක් අමුත්තන්ට නවාතැන් සඳහා ය. සාලය ඔවුන්ගේ කෑම්බීම් සඳහා පහසුකම් සැපයෙන සේ සංවිධානය වූවකි.

තේ කෝප්පය තොල ගානා ඇයට පසුගිය දින කීපයේ නවාතැන තුළ වූ කලබල කාරී එහෙත් ප්‍රබෝධමත් වාතාවරනය සිහියට නැගුනේ නිතැතිණි. නුගේගොඩ, රත්නපුර හා තංගල්ලෙන් පැමිණි පවුල් තුනකින් නවාතැන පිරීඉතිරී ගොස් තිබුණි. මොවුහු අවුරුදු ගනනාවක සිට ම නුවර පෙරහැර බලන්නට විත් මෙහි නවාතැන් ගන්නෝ ය. ඔවුන් නවාතැනට ද එකිනෙකාට ද දැන් අමුත්තන් නො වේ. සෑම අගෝස්තු මසක ම ඔවුන් මේ ගමන එන්නේ නෑගම් යන සතුටිනි. පිරිස පැමිණෙන වාහන මිදුලේ නතර කළ විගස දරුවෝ පිම්මේ ගෙට දුවති. ජනී නැන්දා ඔවුන් සියලු දෙන එක වර සිපවැළඳ ගනී. ඇලිස් නැන්දා හා සිරිමල් අයියා පෙනෙන්නට නො සිටිය හොත් ඔවුන් සොයා ගෙය පුරා දුව යන්නේ ජනී නැන්දා සමග ඇතිපදම් සුරතල් වීමෙන් පසුව ය. සෙසු අය සහෝදරියක හෝ දුවක හෝ මිතුරියක ලෙස ඇය වැළඳ ගනී. නවාතැන මධ්‍යස්ථානය කර මෙම නඩය සති දෙක තුනක් තිස්සේ කෙටි චාරිකාවල යෙදේ. ඒවා එක්දින හෝ දෙදින චාරිකාවන් ය. ජනීගේ සමාගමය වඩා ප්‍රිය කළ සමහරු ඉවුම්-පිසුම් වැඩට උදව් කරමින් ඈ සමග ගෙදර නවතී. ඇතැම් දිනවල ජනී ද චාරිකාවන්ට එක් වේ. වතුර බෝතලයේ සිට විනෝදගමන් සඳහා අවශ්‍ය සෑම දෙයක් ම පිළියල වන්නේ ජනීගේ අධීක්ෂනය හා සහභාගිත්වය යටතේ ය. රසවත් ඒ මෙන් ම පිරිසිදු කෑම සැපයීම තමාගේ ම වගකීමක් ලෙස යි ඇය සැමවිට ම සැලකුවේ. ආපසු යන දින ළං වෙත් ම සැමගේ මුහුණු තරමක ශෝකාකුල බවක් පෙන්වයි. පිටත්ව යන්නට ආසන්න මොහොතේ ඒ ශෝකය උපරිම වේ.
ඇතැමෙක් කොට්ටයක් තුරුලු කර මුව සඟවා ගෙන සිටී. තවෙකෙක් නෙත කඳුළු පිසී. දරුවෝ ජනී නැන්දාට සිරිමල් අයියාට ඔවුන් සමග යන්ට එන ලෙස ඇවිටිලි කරති. සිරිමල් දරුවන් අසල නිහඬව රැඳී සිටී. හිස් අවකාශය දෙස බලාගෙන ජනී තම උකුළෙහි නිදන දරුවෙකුගේ හිස අත ගාන්නී ය. ආපසු ගමන සඳහා ඇවැසි දෑ සොයා බලන්නේ ඇලිස් පමණි.

වර්ෂ අවසාන පාසැල් නිවාඩුවට ද මෙවැනි ම පිරිසක් නවාතැනට පැමිණේ. එතෙක් ගත වන කාලය තරමක් නිහඬ ය. එහෙත් සතියකට කිහිප දෙනෙකු ලැගුම් සොයා නො එන්නේ නො වේ.

ජනී නැන්දේ කව්ද මහත්තේක් ඇවිල්ලා...
සිරිමල් කෑ ගසයි.
ජනී ආලින්දය දෙසට ඉක්මනින් පිය නැගුවේ අෑතට විහිදූ නෙතින් යුතුව ය. ගමන් මල්ලක් උර දරන පිරිමියෙකුගේ ඡායාවක් අඳුරු පසුබිමෙහි ඇයට පෙනේ.
එන්න මහත්තය ඇතුළට...
කාමරයක් ගන්න පුළුවන් වෙයි ද දන්නෑ...?

වාඩි වෙන්නකො..., මහත්තයට බොන්න මොකුත් ගේන්න ද...?

අමුත්තාගේ විඩාපත් බව හැඳිනූ ඇය ඇසුවා ය. ඔහු උරහිසේ වූ ගමන් මල්ල පසෙක තබා අසල වූ පුටුවක ඉඳ ගත්තේ ය.
තවමත් හරිම රස්නෙයි වතුර එකක් නං වඩා හොඳයි. කමිසයේ කර ඔසවා කටින් පවන් සලා ගනිමින් ඔහු කීවේ ය.
සිරිමල් ඉක්මනට ගිහින්.. .අම්මට එන්න කියන්න.

සිරිමල් පණිවිඩය දීමට පිටත්වන්නේ මෝටර් සයිකලයක නැගී යන අභිනයෙනි. ඔහු පිටත් කළ ඇය වතුර ගෙන ඒමට ඉකිමනින් කුස්සිය දෙසට ඇදුනා ය.
අමුත්තා පුටුවේ පහසු ඉරියව්වකට මාරු වුවත් සිතේ සැකයකි. වෙනත් රාත්‍රී නවාතැනක් සොයා යැමට සිදු වේ ද යන්න යි ඒ. තව සතියකින් ආපසු නවසීලන්තය බලා යන්නට සිටින ඔහුට කිසියම් වැඩ කටයුතු කීපයක් කර ගැණීම සඳහා මුළු දවස ම කොළඹ නගරයේ කාෂ්ට අව්වේ රස්තියාදු වීමට සිදු විය. ඔහු ආපසු එමින් සිටි සුඛෝපභෝගී බස් රථය අතරමග නතර විය. අරමුණක් නැතිව ටික දුරක් ඇවිද ගෙන ආ ඔහුට මෙම ස්ථානය ගැන මගදී කතාවට වැටුන අසල් වැසියෙකුගෙන් දැන ගන්නට ලැබුණි.

සැන්දෑවේ ආ අමුත්තා

හැබැයි මහත්තයො මේ දවස්වල එතන මිනිස්සු නතර කර ගන්නව ද දන්නෙ නෑ කෝකටත් ගිහිල්ල බලන්නකො. අර දකුණු පැත්තෙ සුදු ගේට්ටුව තියන ගෙදර, මම මෙතනින් නවතිනව මහත්තයො. වැසියා ගුරු පාරකට හැරුණි.

වතුර වීදුරුව පිළිගන්වා ජනී බන්දේසිය ටීපෝව

පද්මසිරි හේරත්
වෙරිබී වික්ටෝරියා

මත තබා එය අමුත්තාගේ පුටුව දෙසට ළං කර නිවසේ විදුලි පහන් දැල්වීමට ගියා ය. ඒ වන විට ඇලිස් පුතු සමග එහි ළඟා වූවා ය. අමුත්තන්ට නවාතැන් දෙන හෝ නො දෙන තීරණය ගන්නේ ඇලිස් විසිනි. ජනී වයසින් තිස් හැවිරිදි වුවත් ඇලිස්ට ඇය තවම නාඹර තරුණියකි. ඇලිස් පළමු තැන දෙන්නේ ඇගේ ආරක්ෂාවට ය. මත්පැන් හෝ අධික සිගරැට් ගඳ වහනය වන අයට නවාතැන් නො ලැබේ. පිළිගත හැකි එහෙත් සත්‍ය හෝ අසත්‍ය හේතුවක් දෙමින් ඔවුන් ආපසු යැවීමට ඈ හපනියෙකි. කෙටි පිළිසඳරකින් ඇලිස්ට පුද්ගලයෙකුගේ ස්වභාවය පිළිබඳ ව ආසන්න නිවැරදි තක්සේරුවකට එළඹීමට පුළුවන. අමුත්තන් ගැන කෙරෙන එවන් ඇගයීම් නවාතැනේ කටයුතු දුෂ්කරතාවලින් තොරව කරගෙන යාමට ප්‍රමාණවත් වේ. එවන් හැකියාවන් ඇයට ලැබුනේ මනෝවිද්‍යාව හැදෑරීමෙන් නොව, සමාජ ආශ්‍රයෙනි.

මම ටිකක් පරක්කු වුනා..., මහත්තය ඇවිත් ගොඩක් වෙලා ද......?
වැඩි වෙලාවක් නෑ.... සිරිමල් ඉක්මනට පණිවිඩේ දීල තියනව..., මෝටර් සයිකලෙන් නෙ ගියෙ.

එයා යනකොට මම මග එනව මහත්තය.... ඈ කීවේ ලැජ්ජාවෙන් ඇඹරෙන දරුවා දෙස ද කාරුණික බැල්මක් හෙලමිණි. කොහොම ද මෙහෙ ගැන දැන ගත්තෙ....?

ඔහු මග හමුවූ පුද්ගලයාගේ හැඩහුරුකම් කීවේ ය.

ආ.. වඩුබාස් අයිය, අපේ වැඩපල වලට එහෙම ගොඩක් උදව් කරන කෙනෙක්. මහත්තයගෙ නම

කෙටි කතාව

මොකක් ද?
මම වීරසිංහ..., සුදත් වීරසිංහ ඒ කෙටි පිළිසඳරේ ආරම්භය යි.
වීරසිංහ මහතාව කාමරයට කැඳවා ගෙන ගියේ සිරිමල් ය.

අන්කල්ට මූණ හෝදන්න උණු වතුර ඕනැ ද?
සිරිමල්ට නවාතැන්කරුවෙකු අන්කල් වන්නේ තම මවගේ පරීක්ෂණයෙන් සමත් වූවාට පසුව යි. නෑ පුතා...., මට ඇල් වතුර හොඳයි. පුතා ඉස්කෝලෙ කීවෙනි පන්තියෙ ද?

පහේ., මේ ගමන ශිෂ්‍යත්වෙට ඉන්නව හොඳට පාඩම් හෙම කරනව ද...?

ඔව්....., ජනී නැන්ද පාඩම් කියල දෙනව, ගිය සැරේ වාර විබහගෙන් පළවෙනිය...
ආ.. ...හරී ෂෝක් නෙ

අතන බාත්රූම් එක, මොනව හරි ඕනැ නම් මට කතා කරන්න අන්කල්........
කියමින් ළමයා පිටව යන දෙස සුදත් බලා සිටියේ උතුරා යන ආදරයකිණි. ඉගෙනීමට ද ලොකු ඇල්මක් දක්වන කෙළි ලොල් වියේ පසුවන මේ පැංචා රූම් ඇටෙන්ඩන්ට් කෙනෙකුගේ චරිතය රඟ පෑ ආකාරය මනස්කාන්ත ය. ආලින්දයේ පත්තරයක් බලමින් සිටි සුදත්ට රාත්‍රී ආහාරය පිණිස ආරාධනා ලැබුණි. කෑම මේසය අපූර්ව ලෙස පිළියල වී තිබුණි.

ආ... මම විතර ද? ඔක්කොම එක්ක කමු.., කෝ අපේ රූම් බෝයි?

මහත්තය කන්නකො..., අපි පස්සෙ කන්නං... කීවේ ඇලිස් ය. සුදත්ගේ පෙරැත්තය නිසා සැවො ම එකට කෑමට වාඩි විය. තනි ආගන්තුකයෙකු සමග නිවැසියන් එකට කෑම මේසයට ඉඳගත් පළමු වතාව මෙය වේ. ආරම්භයේ දී ම එකිනෙකා කෙරෙහි උපන් සුහදතාවය ද ඊට හේතුවකි.
කෑම රස ද දන්නෙ නැහැ...?

අපි මෙහෙට මස් එහෙම ගේන්නෙ නැහැ.. යැයි ජනී කණගාටුව ප්‍රකාශ කලාය.
අරක්කු..., මස්..එහෙම නැති එකෙන් කරදර හුඟක් අඩු අති නේද? පරිසරය අවබෝධ කර ගෙන සිටි සුගත් කීවේ ය.
නැත්නම්, වැඩිහිටි පිරිමියෙකුත් නැතුව... අපි කොහොම ද මෙතන වැඩ මේ විදිහට කරගෙන යන්නෙ මහත්තයො. ඇලිස්ගේ එකඟතාවය පළ විය.

ජනීගෙ අම්ම තාත්ත එහෙම...? ජනී දෙස දුක් මුසු බැල්මක් හෙලමින් ඇලිස් පිළිතුරු දීමට කල් මැරුවා ය. ඒ වන විටත් ජනී කෑම මේසයෙන් නැගිට ඉවත් ව යන්ට අවසර පතන අයුරින් සුදත් දෙස බැලුවා ය.

පුතාත් ගිහින්.... නැන්දගෙන් ගනන් අහගන්න.
ඇලිස් සිරිමල්ට කීවේ ජනී නෝනීගේ සිත දුක් බර අතීතයට යාම වලක්වන අටියෙනි.

ඒ දෙන්නයි නෝනිගෙ මල්ලියි තුන් දෙනා ම තංගල්ලෙ බිස්නස් වැඩකට ගිහින් එද්දි වාහනේ පෙරලිලා නැති වුනා මහත්තෙයො. දැන් අවුරුදු අටක් විතර වෙනව

ඇලිස් වීරසිංහ මහතා කැටුව කන්තෝරු කාමරයට ගියේ ජනීගේ දුක් බර කතාව සවිස්තර ව ඔහුට කියමිණි. බිත්තියේ එල්ලා ඇති මිය ගිය තිදෙනාගේ පින්තූර ඇය ඔහුට පෙන්වූවා ය. මේකත් ඒ කාලෙදි ම ගත්ත නෝනිගෙ පින්තූරයක්.

එතකොට ජනීට වයස කීය ද...?
විසි දෙකයි හරියට ම. එදා ඉඳල ම තනි රැක්කෙ ඇලිස් අක්ක ද...?
ඔව් මහත්තෙයො, මම නොහිටින්න නෝනිත් ඒ දවස්වල ම පන නහගන්න ඉඩ තිබුන. ඔය හැට් කෙට්ටු වෙලා ගියෙ ඒකෙන් ඇතිවුන කළකිරීමට, පේනව නේද ඉස්සර තිබුන ලස්සන.

ඔව ඔහොම තමයි, ජීවිතේ වෙනසක් වුන දවසක.... ඒව හරී යයි. ඇලිස් ව අස්වසමින් සුදත් කීවේ ය.

එක් සඳුදා උදෑසනක ජනීට ලිපියක් ලැබේ. ඒ සුගත්ට පසු අමුත්තන්ගෙන් තොර ව ගෙවෙන තෙවන සතිය යි. ලිපිනයේ අත් අකුරු ඇයට නුහුරු ය. ඇය යුහුසුලුව ලිපිය විවෘත කලා ය. එය පිටු කීපයකින් යුක්ත ය. එහි කෙළවර සුගත් වීරසිංහ යැයි සඳහන්ව තිබුණි. ඇය නැවත ලියුම් කවරය හරවා බැලුවා ය. එය සාමන්‍ය කවරයකි. ජනී ලියුම කියවූ වේ ඉන් පසුවයි. ඇය එක හුස්මට ලිපිය කියවාගෙන ගියා ය. ඇතැම් කොටස් ඈ නැවත කියවූවා ය.

ඇලිස් අක්කා සිරිමල් හා ඔබ අතර පවතින බැඳීම ද, ආදරය කරුණාව උතුරා ගිය ඔබේ ගති පැවතුම් කෙරෙහි ද මට ඇතිවූ ආශාව මා ඔබට කෙසේ පැහැදිළි කරන්න ද? එවන් පවුලක දුක සැප බෙදා ගෙන ජීවත් වන්ට ඇත්නම්.. යන හැඟීම නවාතැනින් පිටවූ මොහොතේ සිට තවමත් මසිත අසහනයට පත් කරයි.

හසුන පිළිබඳ ව ඇය දිගින් දිගට ම සිතන්නට විය.

සුදත් ආපහු ගිහින් නැහැ... එයා එහෙ ඉන්නෙ කැමැත්තකින් නෙවෙයි . එයාගෙ වයිෆ් එයා ව අත ඇරල සුද්දෙක් එක්ක ගිහින්.. පව්.. එයත් මං වගේ ම අතරමං වුන කෙනෙක්... සුදත් නවාතැනේ ගත කල රාත්‍රිය ඇයට මතක ය. මුහුණ ප්‍රබෝධමත් ය. ඔහු මනා රූ සපුවකින් ද යුක්ත ය, සනීපයට වැඩුන සිරුරක් හා පලල් උඩු කයකින් හෙබි පද්ගලයෙකු විය. පෞරුෂත්වය සැසඳූ කල තම පියාට දෙ වැනි නොවේ. කතාවේ දී තම සහෝදරයා සිහි ගන්වයි. ඒ දෙදෙනා ම ජීවමාන යැයි එදා ඇයට මොහොතකට සිතුණි. තමා සුදත්ට වඩා අවුරුදු ගනනාවක් වැඩිමල් ඇතැ යි ද ඇය සිතුවා ය.

මොනව ද.... නෝනි කල්පනා කරන්නෙ...?
විස්තර කියනු වෙනුවට ඇය ලියුම ඇලිස් අක්කා අත තැබුවා ය. එහි භාෂා විලාසය මිස අන්තර්ගතය ඇලිස් අක්කාට අමුත්තක් නො වේ.

එහෙනං.... නෝනි අපිව දාල යන්න යි හදන්නෙ.....?
ඇලිස් අක්කාගේ මුහුණ කෙළින් ම බැලූ ජනීගේ ඇස් කඳුලින් බොඳ වෙන්නට විය. කම්මුල් නළියන්නට වුණි. ඒ සමග ම මහා ඉකි බිඳුමක හඬ ඇලිස් අක්කාගේ ළය මත කඩා වැටුණු ජනී නෝනීගේ මුවින් පිට විය. ඇලිස් අක්කා දෑතින් ඇගේ මුව ඔසවා ඇය සනසවන්නට තැත් කළා ය.

නෝනි මොකද මේ., මං විහිළුවට නෙ කිව්වෙ..

නැහැ.. ඇලිස් අක්කෙ..., කවදාවත්... නැහැ....
කඳුළු ගලා හැලෙන ඉදිමී රතු වූ කම්මුල් සහිත මුවින් කියන්නට තනන්නේ එය යි. ඉකි බිඳුම් මැද එය නොපැහැදිළි ය. ඇලිස් අක්කා ජනී නෝනී ව මහත් ආයාසයකින් කෙළින් සිටවා, කරණු-කාරණා කියා දී ඇය ව සනසන්නට වෙහෙස වූවා ය.

ඉතින් නෝනි මොකද කියන්නෙ මේ යෝජනාවට?
මට ඇලිස් අක්කව..., සිරිමල්ව... දාල යන්න බැහැ, ඒ නිසා මට බැහැ.

නෝනී සුගත් මහත්තය බඳින්න කැමති නම් එයා ආපහු යන්නෙ නැහැ, මෙහෙ නවතිනව, එයා ලංකාවෙ ඉන්න යි වැඩිය කැමති.

ඇලිස් අක්ක දන්නෙ කොහොම ද...?

නෝනිට හිතා ගන්න බැරි ද...? එදා රෑ සිරිමල් ව පාඩම් අහගන්න යවල අපි මේ ගැන තමයි සෑහෙන වෙලාවක් කතා කර කර හිටියෙ. මම මේ ගැන නෝනිගෙන් ඇහුවෙ නැත්තෙ..., නෝනි හැම... එකට ම බෑ බෑ කියන හින්ද. කොචචරනං යෝජනා ගෙනාව ද ඒ දවස්වල, කෝ...එකකටවත් කැමති වුනා යැ?

වියළී යන කඳුළු අතරින් මතු වූ සිහින් සිනහව ජනීගේ මුව පුරා සෙමින් විහිදී ගියේ ය.

සොබා දහමේ කුරිරුතම සිදුවීම් නිසා ජීවිතය කළකිරුණු ජනීට, ජීවිතයේ අමිහිරි මතකයන් තුළ අතරමං ව සිටි සුදත්ට හෙට මේ නවාතැන සොඳුරු නිවහනක් වනු ඇත. එහි සෙවණැල්ල කරුණා දයා ගුණැති ඇලිස් හා ඇගේ පුතුට රැකවරණයක් වනු ඇත. සුවහසක් විඩාපත් මිනිසුනට සුව පහසු නවාතැනක් ද වනු ඇත. ■

රංජිත් රූබි සමඟ පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER